www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප ජනාධිපති අපේක්ෂක ඉන්දියාවේ ප්‍රසිද්ධ රැස්වීමක් ඇමතීමට යයි

## Sri Lankan SEP presidential candidate to address public meeting in India

**2005 නොවැම්බර් 1**

නොවැම්බර් 17 දාට නියමිත ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනයට තරඟ වදින සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක විජේ ඩයස්, දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ අගනුවර වන චෙන්නායිහි මේ ඉරිදා පැවැත්වෙන ප්‍රසිද්ධ රැස්වීමක් අමතනු ඇත. දශක හතරක් තිස්සේ ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සාමාජිකයකු වන ඩයස්, සසප ප්‍රධාන ලේකම් මෙන් ම ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු ද වේ.

රැස්වීම ශ්‍රී ලංකා සසපයේ සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ජාත්‍යන්තර ඉදිරිදර්ශනය පැහැදිලි කරනු ඇත. සසප මැතිවරන ප්‍රකාශනය පැහැදිලි කරන අයුරු: "සසප ව්‍යායාමයේ මුල්ගල වන්නේ ජාත්‍යන්තරවාදය යි. සසප ඉදිරිපත්ව සිටින්නේ හුදෙක් ශ්‍රී ලංකාව තුල ඡන්ද දිනා ගැනීමට නො ව, ඉන්දියානු උප-මහාද්වීපය පුරා කම්කරුවන් සමාජවාදී ක්‍රියා මාර්ගයක් හා ඉදිරි දර්ශනයක් මත පදනම් වීමේ අවශ්‍යතාව පිලිබඳ සාකච්ඡාවකට මුල පිරීම සඳහා ය."

අද සෑම රටක ම කම්කරු පන්තියට ප්‍රතිමුඛ වන කේන්ද්‍රීය කාරනය නම් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පිපුරුම් සහගත පැන නැගීම යි. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ධජය යටතේ එක්සත් ජනපදය ලෝකයේ ප්‍රධාන භූලෝපායික ප්‍රදේශ මත තම ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ සිය ව්‍යාපාරයේ කොටසක් ලෙස ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය දැනටමත් යටත් කර ගෙන ඇත. මෙලෙස මිලිටරිවාදයට හැරී ගැනීම ශක්තිමත් භාවයක ලකුනක් නො ව, ධනවාදයේ අති මූලික පරස්පර විරෝධතාව -- එනම් ලෝක ආර්ථිකය හා යල් පිනූ ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවත්නා පරස්පර විරෝධතාව -- තම ප්‍රතිවාදීන් සියල්ල ම මත එක රාජ්‍යයක, එනම් එක්සත් ජනපදයේ, ආධිපත්‍යය තහවුරු කර ගැනීම මගින්, විසඳා ගැනීමට දරෙන මංමුලා සහගත ප්‍රයත්නයකි.

ශ්‍රී ලංකාවේ හා කාශ්මීරයේ "සාමය" සඳහා වොෂිංටනය කරන දිරිගැන්වීම එම අධිරාජ්‍යවාදී භූලෝපායේ ම කොටසකි. මෙම ප්‍රදේශ දෙකෙහිම පවත්නා ගැටුම් දැන් කලාපය තුල වැඩෙන ඇමරිකානු ආර්ථික හා භූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනයක් මතු කරයි. දකුනු ආසියාවේ එක්සත් ජනපද මැදිහත්වීම්, සාමය ගෙන එනවා වෙනුවට, අනාගත යුද්ධ සඳහා පදනම සකසන ප්‍රගාඪ අස්ථායිකාරක බලපෑමක් ගෙන එයි.

ඉන්දියානු උප-මහාද්වීපය පුරා ම, පාලක පන්තිවල නියෝජිතයන් සහ ඔවුන්ගේ ස්ටැලින්වාදී හා "වාම" ක්ෂමාලාපකයෝ, බුෂ් පාලනාධිකාරයේ "ත්‍රස්ත විරෝධී යුද්ධය" සමග එක පෙලට වැටී ඇත්තේ එය ස්වකීය අරමුනු වෙනුවෙන් ගසා කෑමට උත්සාහ දරමිනි.

අප කම්කරුවන්ට, තරුන ජනයාට සහ බුද්ධිමතුන්ට ආරාධනා කර සිටින්නේ, යුද්ධයට, වැඩෙන සමාජ අසමානතාවට සහ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරයන්ට විරුද්ධව කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීමේ පදනම මත අව්‍යාජ සමාජවාදී භූලෝපායක අවශ්‍යතාව සාකච්ඡා කරනු පිනිස චෙන්නායිහි සසප ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වන ලෙස යි.

**ස්ථානය: තමාරා ශාලාව, 3 වන මහල, සන් ප්ලාසා සංකීර්නය, 38 ජී.එන්. චෙට්ටි පාර. (අන්නා ගුවන් පාලම අසල)**

**දිනය සහ වේලාව: නොවැම්බර් 6 වන ඉරිදා උදේ 10.00**

© www.wsws.org